NSFAR - 70/71

# වාර්ෂික වාර්තාව

## ஆண்டறிக்கை

# ANNUAL REPORT

## 1970 – 1971

ලංකා ජාතික විද්‍යා සභාව

இலங்கை தேசிய விஞ்ஞான மன்றம்

NATIONAL SCIENCE COUNCIL OF CEYLON

# ලංකා ජාතික විද්‍යා සභාවේ
# 1970/71 මුදල් වර්ෂයේ වාර්ෂික වාර්තාව

**පටුන**

ඇමති තුමා වෙත පිළිගැන්වීමේ ලිපිය

1970/71 ලංකා ජාතික විද්‍යා සභාවේ වාර්ෂික වාර්තාව

1970/71 මුදල් වර්ෂයේ ආදායම් සහ වියදම් ගිණුම්

1971 සැප්තැම්බර් මස 30 වෙනි දිනෙන් අවසානවූ
වර්ෂය සඳහා ශේෂ පත්‍රය

1970/71 මුදල් වර්ෂයේ විගණකාධිපතිගේ වාර්තාව

ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව,
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 7.
1972 අගෝස්තු 15 වැනි දින.

**කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති තුමා,**
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2.

ප්‍රිය මහත්මයාණෙනි,

**1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා ලංකා ජාතික විද්‍යා සභාවේ වාර්ෂික වාර්තාව**

1968 අංක 9 දරණ ලංකා ජාතික විද්‍යා සභා පනතේ 28 වැනි වගන්තිය අනුව, 1970/71 කාල පරිච්ඡේදය සඳහා වූ, ලංකා ජාතික විද්‍යා සභාවේ වාර්ෂික වාර්තාව පහත සඳහන් ලේඛනද සමග ඔබ වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

(අ) ඔඩිටර් ජනරාල් වරයාගේ නිරීක්ෂණ

(ආ) පරීක්ෂිත ආදායම් හා වියදම් ගිණුමේ පිටපතක්

(ඇ) පරීක්ෂිත ශේෂ පත්‍රයේ පිටපතක්

මෙයට,
ඔබගේ විශ්වාස,
**ඕ. ඩබ්ලිව්. ජයරත්න**
සභාපති
ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව

# 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ලංකා ජාතික විද්‍යා සභාවේ

# වාර්ෂික වාර්තාව

**විද්‍යා සභාව**

**සභාපති** :— ඒ. එන්. එස්. කුලසිංහ මහතා

**සාමාජිකයන්** :—
මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා (උප සභාපති)
බී. ජේ. පී. අලස් මහතා (1971 මාර්තු මස ඉල්ලා අස්විය)
මහාචාර්ය වී. අප්පාපිල්ලේ මහතා
මහාචාර්ය එච්. ක්‍රෑස් මහතා
මහාචාර්ය සී. දහනායක මහතා
ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු මහතා
එල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා
ජේ. වී. පොන්සේකා මහතා
ආචාර්ය චාල්ස් සෙන්ට් ජෝර්ජ් මහතා
ආචාර්ය එස්. ඥනලිංගම් මහතා (1971 පෙබරවාරි මස ඉල්ලා අස්විය)
මහාචාර්ය එච්. ඒ. ද එස්. ගුණසේකර මහතා
මහාචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහතා (1971 මාර්තු මස ලේකම් ජනරාල් ධුරයට පත් කරන ලදී)
වෛද්‍යාචාර්ය ආර්. පී. ජයවර්ධන මහතා
ආචාර්ය ජේ. ඩබ්ලිව්. එල්. පීරිස් මහතා
මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරෙයිරා මහතා
මහාචාර්ය පී. පී. ජී. එල්. සිරිවර්ධන මහතා
ඒ. ඊ. කේ. තිස්සවේරසිංහ මහතා
ආචාර්ය ආර්. ඒ. එච්. වීරකෝන් මහතා

ඉහත සඳහන් විද්‍යා සභාවේ නිල කාලය 1971 අප්‍රියෙල් 22 වෙනි දින අවසන් වූ අතර, 1971 අප්‍රියෙල් මස 22 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සාමාජිකයින් කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් විද්‍යා සභාවට යලි පත් කරන ලදී.

ඒ. එන්. එස්. කුලසිංහ මහතා (සභාපති)
මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා (උප සභාපති)
මහාචාර්ය වී. අප්පාපිල්ලේ මහතා
මහාචාර්ය එච්. ක්‍රෑස් මහතා
මහාචාර්ය සී. දහනායක මහතා
ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු මහතා
එල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා
ජේ. වී. පොන්සේකා මහතා
ආචාර්ය චාල්ස් සෙන්ට් ජෝර්ජ් මහතා
මහාචාර්ය එච්. ඒ. ද එස්. ගුණසේකර මහතා
වෛද්‍යාචාර්ය ආර්. පී. ජයවර්ධන මහතා
ආචාර්ය ජේ. ඩබ්ලිව්. එල්. පීරිස් මහතා
මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරෙයිරා මහතා
මහාචාර්ය පී. පී. ජී. එල්. සිරිවර්ධන මහතා
ඒ. ඊ. කේ. තිස්සවේරසිංහ මහතා
ආචාර්ය ආර්. ඒ. එච්. වීරකෝන් මහතා

1968 අංක 9 දරණ ලංකා ජාතික විද්‍යා සභා පනතේ 7 වැනි ඡේදයේ (2) වැනි උපඡේදය අනුව මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා උප සභාපති ධුරයට තෝරා පත් කර ගන්නා ලදී.

**ලේකම් ජනරාල් :—** ආචාර්ය සී. ආර්. පානබොක්කේ මහතා (71-2-28 දින දක්වා)
ආචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහතා (71-3-1 දින සිට)

**කාර්ය මණ්ඩලය :—** විද්‍යා සභාවේ ජ්‍යෙෂ්ඨ තනතුරු වලට අවශ්‍ය සුදුසු අධ්‍යාපනික සුදුසුකම් හා දක්ෂතා ඇති අයදුම් කරුවන් නොසිටි නිසා එම තනතුරු පිරවිය නොහැකි විය. කෙසේ වුවද, විද්‍යා සභාවේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය සඳහා වූ, සේවා යෝජන වැඩ පිළිවෙල හා වැටුප් පරිමාණයන් සංශෝධනය කරන ලදුව, කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් අනුමත කරන ලදී. සුළු සේවකයන් සඳහා වූ වැටුප් පරිමාණයන් හා සේවා යෝජන වැඩ පිළිවෙල, රාජපක්ෂ කොමිටි වාර්තාව පිටවන තුරු, සංශෝධනය නොකළ යුතු යයි අමාත්‍යාංශය මගින් තීරණය කරන ලද නිසා, සංශෝධනය නොකරන ලදී. අදාල කාලපරිච්ඡේදය අවසානයේදී සේවක මණ්ඩලය,

ලේකම් ජනරාල් - ජී. සී. එන්. ජයසූරිය මහතා (බී. එස්. සී. (ලංකා), පී. එච්. ඩී. (ෂෙපීල්ඩ්), එෆ්. ආර්. අයි. සී.)

විද්‍යාත්මක නිලධාරී - කමලා ද සොයිසා මහත්මිය (බී. එස්. සී., පී. එච්. ඩී.) (ලන්ඩන්), ඩී. අයි. සී.)

මාණ්ඩලික සහකාර - ජේ. සී. පී. ජයසිංහ මහතා බී. කොම්. (ලංකා)
ලිපිකරු/යතුරු ලේඛක දෙදෙනෙකු, එක් කාර්යාල සහායකයෙකු, එක් තාවකාලික කම්කරුවෙකු සහ මුරකරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත විය.

**ආයතන කමිටුව :—**

අදාල කාලපරිච්ඡේදයේදී, ආයතන කමිටුව, සභාපති, උප සභාපති, එල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා සහ ලේකම් ජනරාල් ගෙන් සමන්විත විය.

**පර්යේෂණ ආධාර කමිටුව :—**

පහත සඳහන් අය මෙම කමිටුවේ සේවය කරන ලදී.
එල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා
මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා
මහාචාර්ය වී. අප්පාපිල්ලේ මහතා
ආචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහතා
වෛද්‍යාචාර්ය ආර්. පී. ජයවර්ධන මහතා
ආචාර්ය ජේ. ඩබ්ලිව්. එල්. පීරිස් මහතා
මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරෙයිරා මහතා

1970/71 සඳහා පර්යේෂණ ආධාර දීමනා පිරිනැමීමට, අයදුම් පත් කැඳවන ලදුව, අයදුම් පත් 44 ක් ලැබිණි. මෙයින් අයදුම් පත් 30 ක් ජාතික විද්‍යා සභාව විසින්, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයට අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී. විද්‍යා සභාවේ සියළුම නිර්දේශයන්, කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අනුමත කරන ලදී. (මෙසේ අනුමත කරන ලද යෝජනා ක්‍රම වල ලැයිස්තුවක් අමුණා ඇත. -ඇමුණුම් 1)

**ශිෂ්‍යත්ව මණ්ඩලය :—**

ශිෂ්‍යත්ව/අධිශිෂ්‍යත්ව ප්‍රදානය පිළිබඳ සංශෝධිත නීති රීති, කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින්, අනුමත කරන ලදුව, 1971 මැයි මස ගැසට් පත්‍රයේ පල කරන ලදී. මෙම ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව පාලනය කරන මණ්ඩලය, ශිෂ්‍යත්ව මණ්ඩලය නමින් හැඳින්විනි.

පහත සඳහන් අය ශිෂ්‍යත්ව මණ්ඩලයේ සේවය කරන ලදී.

මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා (සභාපති)
මහාචාර්ය. එච්. ක්‍රෑස් මහතා

වෛද්‍යාචාර්ය ආර්. පී. ජයවර්ධන මහතා
ආචාර්ය ජේ. ඩබ්ලිව්. එල්. පීරිස් මහතා
මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරේසිරා මහතා
මහාචාර්ය පී. පී. ජී. එල්. සිරිවර්ධන මහතා
ආචාර්ය ආර්. ඒ. එච්. වීරකෝන් මහතා
ආචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහතා (ලේකම් ජනරාල්)

1970/71, ශිෂ්‍යත්ව/අධිශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා, අයදුම් පත් කැඳවන ලද අතර, ශිෂ්‍යත්ව මණ්ඩලය විසින් කරන ලද පහත සඳහන් නිර්දේශයන් ජාතික විද්‍යා සභාව විසින් පිළිගන්නා ලදුව, කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අනුමත කරන ලදී.

1. ඩබ්ලිව්. එම්. කේ වීරසේකර මෙනෙවිය (බී. එස්. සී. විද්‍යෝදය)
   "An attempt to develop a method for the control of the Red Weevil (Rhynohophorus ferrugineus) pest of coconut plantations by radiation – induced male sterility"
   නම් ඇයගේ පර්යේෂණ යෝජනා ක්‍රමය සඳහා.

2. වී. යු. ද එස්. ජයසූරිය (බී. ඇස්. සී. විද්‍යෝදය)
   "To test for mutagenic effect of some pesticides commonly used in Ceylon"
   නම් ඔහුගේ පර්යේෂණ යෝජනා ක්‍රමය සඳහා.

3. පී. කේ. ජයතිලක මෙනෙවිය (බී. එස්. සී. විද්‍යෝදය)
   "Irradiation effects on yeast with special reference to formentation, morphology and enzymes distribution"
   නම් ඇයගේ පර්යේෂණ යෝජනා ක්‍රමය සඳහා

**විද්‍යා සභාවේ අනෙකුත් කටයුතු :—**

**1. විද්‍යා ප්‍රතිපත්තිය පිළිබඳ අනුකමිටුව.**

විද්‍යා ප්‍රතිපත්තියේ අධ්‍යයනය කළ යුතු සියළුම අංශයන් පිළිබඳ සොයා බැලීමට, ඒ. එන්. එස්. කුලසිංහ මහතා, මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා, එල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා, මහාචාර්ය වී. අප්පාපිල්ලේ මහතා හා ආචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහතා (ලේකම් ජනරාල්) ගෙන් සමන්විත අනු කමිටුවක් විද්‍යා සභාව විසින් පත් කරන ලදී.

**2. ජීවයේ මුල් පරිනාමය පිළිබඳ වූ යුනෙස්කෝ ආයතනය.**

යුනෙස්කෝවේ අනුග්‍රහය යටතේ ලංකා ජාතික විද්‍යා සභාව හා යුනෙස්කෝ ලංකා ජාතික මණ්ඩලය එක්වී "ජීවයේ මුල් පරිනාමය" පිළිබඳ පුහුණු වීමේ පාඨ මාලාවක් පැවැත්වීමට තීරණය කර ඇත. මෙම පාඨමාලාව පවත්වනු ලබනු ඇත්තේ, පේරාදෙනිය ලංකා විශ්ව විද්‍යාලයේය. මෙම ආයතනයට ලංකාවේ සහ අසල්වැසි ආසියානු රටවලින් නියෝජිතයන් සහභාගි වනු ඇත. මෙම පීඨය ආචාර්ය සිරිල් පොන්නම්පෙරුම සහ ලෝකයේ විවිධ ප්‍රදේශවලින් සහභාගි වන සුප්‍රසිද්ධ අණුක ජීව විද්‍යාඥයන්ගෙන් සමන්විත වනු ඇත. මෙම පාඨමාලාව 1972 අප්‍රියෙල් මස පැවැත්වීමට නියමිත අතර, පේරාදෙනිය ලංකා විශ්ව විද්‍යාලයේ ජීව රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ ආචාර්ය ටී. ඩබ්ලිව්. වික්‍රමනායක මහතා විසින් සම්බන්ධීකරණ කටයුතු කරනු ඇත.

**3. ලංකා විද්‍යා අභිවෘධි සංගමයට දෙන ලද ආධාර දීමනා.**

ලංකා විද්‍යා අභිවෘධි සංගමයේ පොදු පර්යේෂණ කමිටුව මගින් පිළියෙල කරන ලද "Union List of Periodicals" හි පිටපත් 250 ක් අනුපිටපත් කිරීම සඳහා, විද්‍යා සභාව විසින්, ලංකා විද්‍යා අභිවෘධි සංගමයට රු : 2640/- ක ආධාර දීමනාවක් අනුමත කරන ලදී.

"මිනිසා සහ ඔහුගේ පරිසරය" පිළිබඳ සම්මන්ත්‍රණයේ පිටපත් 500 ක් ප්‍රකාශයට පත් කිරීම සඳහාද, රු : 1625/- ක ආධාර දීමනාවක් ලංකා විද්‍යා අභිවෘධි සංගමයේ ඩී අංශයට අනුමත කරන ලදී.

මෙම ප්‍රකාශන දෙක විකිණීමෙන් ලැබෙන සියළු මුදල්, විද්‍යා අභිවෘද්ධි සංගමයේ ප්‍රකාශන අංශයට බැර යුතු අතර, එම බැර කිරීම් පිළිබඳව වරින් වර ජාතික විද්‍යා සභාවට ගිණුම් ප්‍රකාශණ ඉදිරිපත් කළ යුතුය.

## 4. මිනිසා සහ ජීවගෝලය පිළිබඳවූ අන්තර් රාජ්‍යමය හා අන්තර් විද්‍යාත්මක ක්‍ෂෙත්‍රමය වැඩ සටහන.

මෙම වර්ෂයේ "මිනිසා සහ ජීවගෝලය" පිළිබඳ වූ, අන්තර් විද්‍යාත්මක ක්‍ෂෙත්‍රමය හා අන්තර් රාජ්‍යමය වැඩ සටහනක් යුනෙස්කෝව මගින් දියත් කොට ඇත. මෙම වැඩ සටහන ලංකාව තුල, ලංකා ජාතික විද්‍යා සභාව, ලංකා ජාතික යුනෙස්කෝ මණ්ඩලය හා එක්ව සම්බන්ධීකරණය කරනු ඇත. මෙම වැඩ සටහන සම්බන්ධීකරණය කිරීම සඳහා වූ, ජාතික කමිටුවට කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමති තුමාගේ එකඟත්වය ඇතිව ගරු අධ්‍යාපන ඇමති තුමා විසින්, පහත සඳහන් අය පත් කොට ඇත.

මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා (සභාපති)
කේ. ඩී. ආරියදාස මහතා
එම්. අත්පුතනාදන් මහතා
මහාචාර්ය එච්. ක්‍රෑස් මහතා
මහාචාර්ය සී. දහනායක මහතා
ආචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහතා
ටී. ටී. ජේයරාජ් මහතා
ඒ. ඇද්. ඒ. පකීර් මහතා
මහාචාර්ය පී. පී. ජී. එල්. සිරිවර්ධන මහතා
ඒ. ටී. කේ. තිස්සවේරසිංහ මහතා
එල්. සී. ඩී. ද එස්. විජේසිංහ මහතා
ආචාර්ය කමලා ද සොයිසා මහත්මිය (ලේකම්)

පහත සඳහන් පර්යේෂණ පිළිබඳ පුළුල් ක්‍ෂෙත්‍රයන් තුල්, ලංකාවේ සහභාගිත්වය සිදුවිය යුතුයයි කමිටුව මගින් තීරණය කරන ලදී.

(1) වර්ගීකරණය පිළිබඳ අධ්‍යයනය

(2) පරිසරය පිළිබඳ අධ්‍යයනය

(3) ස්වභාවික සම්පත් පිළිබඳ වූ සමීක්‍ෂණය

(4) පරිසරය අපවිත්‍රවීම පිළිබඳ අධ්‍යයනය

මේ සඳහා ජාතික විද්‍යා සභාව විසින් නිර්දේශ කරන ලද ආධාර දීමනා 6 ක්, කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අනුමත කර ඇත. (අමුණා ඇති ලැයිස්තුව බලන්න - ඇමුණුම් 11)

## 5. ආහාර කමිටුව

පහත සඳහන් සංවිධායකයින් යටතේ අනුකමිටු ඇතට වාර්තා පිළියෙල කරති.

(1) වසංගත මර්ධනය පිළිබඳ පරීක්‍ෂණය: ටී. ටී. ජේයරාජ් මහතා

(2) ආහාර ද්‍රව්‍ය හා ආහාර සඳහා මූලයන් වශයෙන් කෘෂිකාර්මික හා කාර්මික අපද්‍රව්‍ය නිශ්පාදන ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව: පී. රාමනාදන් මහතා

(3) ආරක්‍ෂිත ආහාර ද්‍රව්‍ය: ආචාර්ය බී. වී. ද මෙල් මහත්මිය

(4) සීනි හා පිටි වැනි රාශි ආහාර හැසුරුවීම, එම ආහාර ද්‍රව්‍ය අලෙවි කිරීම, බෙදා හැරීම සහ ඇගිරීම: ආචාර්ය එන්. එන්. ද සිල්වා මහතා

(5) ආහාර ප්‍රමිතිකරණය, තත්ත්ව පාලනය සහ ගබඩා කිරීම: ඒ. ඒ. හුවර් මහතා

ආහාර පිළිබඳ පර්යේෂණ සඳහා ඇති පර්යේෂණාගාර පහසුකම් පිළිබඳ ආහාර කමිටුව මගින් පිළියෙල කරන ලද, ප්‍රශ්න මාලාවක් විශ්ව විද්‍යාල, රජයේ දෙපාර්තමේන්තු. පර්යේෂණ ආයතන, සහ පෞද්ගලික අංශයේ ආයතන වලට බෙදා හරින ලදී. සම්පූර්ණ කරන ලද මෙම ප්‍රශ්න මාලාවන්ගෙන් ලබාගත් තොරතුරු වලින් ඇතට වාර්තාවක් පිළියෙල වෙමින් පවතී.

**6. ස්වාභාවික සම්පත් පිළිබඳ කමිටුව**

මෙම කමිටුවේ කටයුතු දැනට කෙරීගෙන යන අතර එහි වාර්තාව ඉක්මණින් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

**7. උසස් අධ්‍යාපනය පිළිබඳ වූ ජයරත්න වාර්තාව**

උසස් අධ්‍යාපනය සඳහා වූ ජයරත්න වාර්තාව පිළිබඳව සොයා බලා, අධ්‍යාපන අමාත්‍යාංශයට යැවීම සඳහා සංදේශයක් පිළියෙල කිරීමට එල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා (සභාපති), ඒ. ඊ. කේ. තිස්සවේරසිංහ, මහතා, මහාචාර්ය සී. දහනායක මහතා යන අයගෙන් සමන්විත අනුකමිටුවක් විද්‍යා සභාව විසින් පත් කරන ලදී.

**8. විද්‍යා සභාව ප්‍රතිසංවිධානය කිරීම**

විද්‍යා සභාව ප්‍රතිසංවිධානය කිරීම සඳහා වූ යෝජනාව විද්‍යා සභාව විසින් අනුමත කරන ලදුව කම්කරු හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමති තුමා විසින් පිළිගෙන ඇත. මෙම යෝජනාව කම්කරු හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඇත.

**9. පර්යේෂණ හා අත්හදා බැලීම් වර්ධනය සඳහා වූ මිනිස් ශ්‍රමය හා වැය කිරීම් පිළිබඳ වූ වාර්ෂික සමීක්ෂණය**

විග්‍රහය සහ සැලසුම් සම්පාදනය සඳහා ප්‍රතිපත්ති සකස් කරන්නන්ට හා සැලසුම් සම්පාදකයන්ටද, විශේෂයෙන් විද්‍යාව හා කාර්මික ඥානය පිළිබඳ උනන්දුවක් දක්වන්නන්ට ද, අවශ්‍යවූ තොරතුරු ඒකරාශි කිරීම සඳහා, වාර්ෂිකව, පර්යේෂණ හා අත්හදා බැලීම් වැඩි දියුණු කිරීම පිණිස වූ මිනිස් ශ්‍රමය හා වියදම් පිළිබඳ සමීක්ෂණයක් කිරීමට ලංකා ජාතික විද්‍යා සභාව තීරණය කර ඇත. ලෝකයේ විද්‍යාත්මක හා කාර්මික ශිල්පීය කටයුතු සඳහා කැපකර ඇති සවිස්තර සංඛ්‍යා ලේඛන ඒකරාශි කිරීමට යුනෙස්කෝව දරන උත්සාහයේ දීද, මෙම තොරතුරු වලින් කොටසක් අවශ්‍යව ඇත.

මෙම අරමුණ ඉටුකර ගැනීමේ බලාපොරොත්තුව ඇතිව, පර්යේෂණ හා අත්හදා බැලීම් වැඩි දියුණු කිරීමේ නියැලී ඇතැයි සිතිය හැකි රජයේ දෙපාර්තමේන්තු, අධ්‍යාපනික ආයතන, සංස්ථා සහ පෞද්ගලික අංශයේ ආයතන වෙත යැවීම සඳහා දැනට ප්‍රශ්න මාලා පිළියෙල කරගෙන යනු ලැබේ. මෙම සමීක්ෂණය වසරක් පාසා නොකඩවා කරගෙන යනු ඇත.

71–11–23

# ඇමුණුම I

## 1970/71 වර්ෂය සඳහා අනුමත කරන ලද
# පර්යේෂණ ආධාර දීමනා

| ආධාර දීමනා අංකය | නම සහ ලිපිනය | යෝජනා ක්‍රමයේ මාතෘකාව | අනුමත කළ මුදල රු. ශත |
|---|---|---|---|
| ජාවිසඅ/1/17/24 | ආචාර්ය එස්. සෝතීස්වරන් මහතා, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය. | Chemical studies on natural rubber (substitution of the rubber molecule to change the elastic properties). | 8,458 . 25 |
| ජාවිසඅ/1/17/25 | ආචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා, කෘෂිකර්ම විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Factors affecting grain sterility of improve varieties of rice **Oryza sativa L**. | 1,750 . 00 |
| ජාවිසඅ/1/17/26 | වී. පවනසාසිවම් මහතා, කෘෂිකර්ම විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Micronutrient studies in great soil groups of Ceylon. | 14,190 . 75 |
| ජාවිසඅ/1/17/27 | ආචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා, කෘෂිකර්ම විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Agronomic studies on the cultivation of manioc, **Manihot utilisimma.** | 3,400 . 00 |
| ජාවිසඅ/1/17/28 | ආචාර්ය ඩබ්. ආර්. බ්‍රෙකන්රිඩ්ජ් මහතා, සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Studies on the reproductive physiology of the land snail **Achatina fulica** (the Kalutara snail). | 9,200 . 00 |
| ජාවිසඅ/1/17/29 | ආචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා, කෘෂිකර්ම විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Use of Soyabean (**Glycine max L**) in multiple cropping programmes. | 2,050 . 00 |
| ජාවිසඅ/1/17/30 | ආචාර්ය එච්. එම්. ඩබ්. හේරත් මහතා, කෘෂිකර්ම විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Strain selection and cultural requirements of lemon grass for the mid-Country wetzone Ceylon. | 2,100 . 00 |
| ජාවිසඅ/1/17/31 | ආචාර්ය එච්. එම්. හේරත් මහතා, කෘෂිකර්ම විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | A study of the factors that affect growth and reproduction of Salvinia (auriculata) with a view to find a method of biological control. | 4,150 . 00 |
| ජාවිසඅ/1/17/32 | ආචාර්ය බී. එල්. තෙන්නකෝන් මහතා, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Laboratory measurement of soil parameters. | 32,892 . 50 |
| ජාවිසඅ/1/17/33 | එස්. දිසානායක මහතා, ජීව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Analysis of urinary Amino acids of mentally retarded children. | 3,212 . 50 |
| ජාවිසඅ/1/17/34 | වෛද්‍යාචාර්ය බී. සෙනෙවිරත්න මහතා, වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙනිය. | The management of Hookworm disease in Ceylon. | 8,200 . 00 |
| ජාවිසඅ/1/17/35 | මහාචාර්ය එස්. එන්. අර්සකුලරත්න මහතා, බැක්ටීරිය වේදය පිළිබඳ දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | The aetiology of necrotizing enteritis. | 2,200 . 00 |
| ජාවිසඅ/1/17/36 | ආචාර්ය ඒ. තුරෙයිරාජා මහතා, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Stress-strain relationship for sand. | 31,147 . 50 |
| ජාවිසඅ/1/17/37 | ආචාර්ය බී. එම්. ඩබ්. ගුණරත්න මහතා, පරපෝෂ වේදය පිළිබඳ දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. | Lymphographic study of filarial patients from endemic areas in Ceylon. | 3,600 . 00 |

| ආධාර දීමනා අංකය | නම සහ ලිපිනය | යෝජනා ක්‍රමයේ මාතෘකාව | අනුමත කළ මුදල රු. ශත |
|---|---|---|---|
| ජාවිසඅ/1/17/38 | ආචාර්ය ආර්. එස්. රාමක්‍රිෂ්ණ මහතා, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ. | Investigation of the complexes of Titanium, Vanadium, Zirconium and Group III B metal ions with oxygen, sulphur and selenium containing ligands. | 19,400.00 |
| ජාවිසඅ/1/17/39 | ආචාර්ය ඩබ්. ඒ. එස්. ද සිල්වා මහතා, වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ. | Study of Lipoproteins in vascular disease (coronary & cerebral) in Ceylon, in relation to diet. | 2,859.25 |
| ජාවිසඅ/1/17/40 | ආචාර්ය ඒ. සී. ද ජෝං මහත්මිය, පරපෝෂ වේදය පිළිබඳ දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ. | Investigation into the life cycle of **Sarcoocyst s**, Coccidia and other related organisms in rodents and other vertebrates. | 3,161.60 |
| ජාවිසඅ/1/17/41 | මහාචාර්ය කේ. එන්. සෙනෙවිරත්න මහතා, භෞත වේදය පිළිබඳ දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ. | The permeability of endoneurial vessels in diabetes mellitus. | 8,400.00 |
| ජාවිසඅ/1/17/42 | ආචාර්ය සී. සී. සමරසිංහ මහතා, ව්‍යවච්ඡේදය පිළිබඳ දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ. | An investigation into the origin and termination of the myelinated nerve fibres of the oesophagus and the response of end-plates to enzyme and nerve section. | 7,440.00 |
| ජාවිසඅ/1/17/43 | ආචාර්ය ඩබ්. ඊ. රත්නායක මහතා, ජෛවීය විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යෝදය විශ්ව විද්‍යාලය. | To initiate and continue formal genetical studies of **Culex pipiens fatigans** (mosquito vector of filariasis). | 35,457.90 |
| ජාවිසඅ/1/17/44 | මහාචාර්ය ඒ. සී. ජේ. වීරකෝන් මහතා, ජෛවීය විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යෝදය විශ්ව විද්‍යාලය. | Irradiation effects on yeast with special reference to fermentation, morphology and enzyme distribution. | 2,390.00 |
| ජාවිසඅ/1/17/45 | ආචාර්ය එම්. ඩබ්. සී. ධර්මවර්ධන මහතා, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යෝදය විශ්ව විද්‍යාලය. | Comparative account of yeast isolated from fermented saps of palms in Ceylon. | 7,200.00 |
| ජාවිසඅ/1/17/46 | අචාර්ය ඩබ්. ඊ. රත්නායක මහතා, ජෛවීය විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යෝදය විශ්ව විද්‍යාලය. | To test for mutagenic effect of some pesticides commonly used in Ceylon. | 1,400.00 |
| ජාවිසඅ/1/17/47 | මහාචාර්ය ඒ. සී. ජේ. වීරකෝන් මහතා, ජෛවීය විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යෝදය විශ්ව විද්‍යාලය. | An attempt to develop a method for the control of Red Weevil (**Rhynchophorus ferrugineus**) pest of coconut plantation by radiation induced male sterility. | 5,200.00 |
| ජාවිසඅ/1/17/48 | වෛද්‍ය ඒ. සතාසිවම් මහතා, වෛද්‍ය පර්යේෂණ ආයතනය. | Prolongation of survival time in Rabies using supportive therapy. | 4,100.00 |
| ජාවිසඅ/1/17/49 | වෛද්‍ය එන්. නාගරත්නම් මහතා, රජයේ රෝහල, ගම්පහ. | 1. Sickle-cell-thalossaemia associated with HB D.<br>2. Hereditary Spherocytosis associated with HB E.<br>3. Unstable Haemoglobin in a Sinhalese family. | 150.00 |
| ජාවිසඅ/1/17/50 | වෛද්‍ය එන්. නාගරත්නම් මහතා, රජයේ රෝහල, ගම්පහ. | Liver disease and allied disorders. | 300.00 |
| ජාවිසඅ/1/17/51 | ආචාර්ය එම්. ඒ. වී. දේවනාදන් මහතා, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය, කොළඹ 7.<br>ආචාර්ය ආර්. ඕ. බී. විජේසේකර මහතා, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය, කොළඹ 7. | Synthesis of Fine Chemicals from Ceylon Essential Oils. | 22,150.00 |
| ජාවිසඅ/1/17/52 | ආචාර්ය ආර්. ඕ. බී. විජේසේකර මහතා, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය, කොළඹ 7.<br>සී. එල්. එම්. නෙත්සිංහ මෙනෙවිය, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය, කොළඹ 7. | Preparation of a Compendium of Spices and Essential Oils of Ceylon. | 8,700.00 |

## ඇමුණුම II

# 1970 / 71 මිනිසා සහ ජීවගෝලය වැඩසටහන සඳහා අනුමත කරන ලද පර්යේෂණ ආධාර දීමනා

| ආධාර දීමනා අංකය | නම සහ ලිපිනය | යෝජනා ක්‍රමයේ මාතෘකාව | අනුමත කළ මුදල රු. ශත |
|---|---|---|---|
| එම්.බී/71/1 | මහාචාර්ය එච්. කෲස් මහතා, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙනිය. මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ. | Preparation of check lists of the fauna and flora of Ceylon. | 20,000 . 00 |
| එම්.බී/71/2 | මහාචාර්ය අයි. බාලසූරිය මහතා, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය. | Study of the problems associated with nutrition and development of mycorrhiza in Pine Plantation. | 11,200 . 00 |
| එම්.බී/71/3 | ඊ. ඊ. ජෙයරාජ් මහතා, ල. වි. කා. ප. ආ., සී. සන්කුනනාදන් මහතා, රජයේ රස පරීක්ෂකගේ දෙපාර්තමේන්තුව, මහාචාර්ය පී. පී. ජී. එල්. සිරිවර්ධන මහතා, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ, ආචාර්ය කේ. ජී. ධර්මවර්ධන මහතා, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ. | Pollution studies of the Kelani river. | 14,700 . 00 |
| එම්.බී/71/4 | ආචාර්ය එස්. විග්නරාජා මහතා, සත්වවිද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ. | Study of leaf skeletonizers and defoliators in Teak plantations. | 7,500 . 00 |
| එම්.බී/71/5 | ඩබ්. ආර්. එච්. පෙරේරා මහතා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | Demarcating and fencing I. B. P. arboreta | 22,700 . 00 |
| එම්.බී/71/6 | ආචාර්ය එම්. ඩී. දසනායක මහතා, උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙනිය | Preparation of inventories of fauna and flora in I. B. P. arboreta. | 7,500 . 00 |

# ලංකා ජාතික විද්‍යා සභාව

## 1971 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| **සේවක මණ්ඩල වේතන :** | | | | |
| වැටුප් සහ දීමනා | 50,090.49 | | ලංකා ජාතික විද්‍යා සභා ආධාර මුදල් ගිණුමට මාරු කරන ලද වර්ෂය තුළ ආදායම ඉක්මවූ වියදම් | 102,471.08 |
| සේවක අර්ථසාධක අරමුදල්- විද්‍යා සභා දයක මුදල් | 6,662.21 | | | |
| විශ්‍රාම වැටුප් දයක මුදල් | 1,622.50 | | | |
| අතිකාල දීමනා | 1,237.26 | | | |
| | | 59,612.46 | | |
| **කර්යාල පරිපාලනය ;** | | | | |
| ලිපි ද්‍රව්‍ය | 2,552.45 | | | |
| තැපැල් ගාස්තු | 351.65 | | | |
| කසල ශෝධක ගාස්තු | 133.00 | | | |
| බැංකු ගාස්තු | 113.75 | | | |
| ගෙවල් කුලී | 11,400.00 | | | |
| විවිධ වියදම් | 238.23 | | | |
| දුරකථන ගාස්තු | 1,780.14 | | | |
| විදුලිබල ගාස්තු | 493.20 | | | |
| ප්‍රචාරන වියදම් | 7,915.75 | | | |
| ගණන් පරීක්ෂණ ගාස්තු | 500.00 | | | |
| ගණන පරීක්ෂණ ගාස්තු (පසුගිය වර්‍ෂයේ ගිණුම ගැලපීමට) | 300.00 | | | |
| ක්ෂයවීම් | 3,866.85 | | | |
| කායාලීය ගමන් ගාස්තු | 460.40 | | | |
| අසම්භාව්‍ය වියදම් | 1,906.12 | | | |
| | | 32,011.54 | | |
| **විද්‍යා සභාවේ වියදම් :** | | | | |
| සමාජිකයින්ට ගෙවූ ගමන් ගාස්තු | 2,585.05 | | | |
| ජාත්‍යන්තර විද්‍යා සමිතීන්ට දයක මුදල් | 6,226.06 | | | |
| සංග්‍රහ වියදම් | 148.47 | | | |
| මුද්‍රණ හා ප්‍රකාශණ | 1,625.00 | | | |
| සම්මන්ත්‍රණ සහ සාකච්ඡා | 222.50 | | | |
| | | 10,847.08 | | |
| | | 102,471.08 | | 102,471.08 |

1972 මාර්තු 7.

අ. ක. / බී. ඒ. අබේවික්‍රම
උප සභාපති, ජාතික විද්‍යා සභාව.

අ. ක. / ජී. සී. එන්. ජයසූරිය
ලේකම් ජනරාල්, ජාතික විද්‍යා සභාව.

# ලංකා ජාතික විද්‍යා සභාව

## 1971 සැප්තැම්බර් 30 දිනට ශේෂ පත්‍රය

| | | | |
|---|---|---|---|
| **ජාතික විද්‍යා සභා අරමුදල** | | | |
| 1968 ජුලි මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාල පරිච්ඡේදයට පාර්ලිමේන්තුව විසින් වැය ශීර්ෂ සම්මත කරන ලදුව අරමුදලට ගෙවන ලද මුදල් | 340,660.00 | | |
| **එකතුකළා**- වර්ෂයතුල ගෙවනලද ප්‍රමාණය | 141,000.00 | | |
| ජීවයේ මුල් පරිනාමය පිළිබඳ වැඩ සටහනට සහභාගි වීමට යුනෙස්කෝ වෙන් ලැබුණු මුදල | 5,000.00 | | |
| පර්යේෂණ සඳහා අත්හද බැලීම් වර්ධනය සඳහා මිනිස් ශ්‍රමය හා වැය කිරීම් පිළිබඳ වූ වාර්ෂික සමීක්ෂණයට ගෙවීම් වශයෙන් අමාත්‍යාංශයෙන් ලැබුණ මුදල | 3,000.00 | 489,660.00 | |
| **අඩුකළා**-1968 ජුලි 1 දින සිට 1970 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා අරමුදලට අය කරන ලද ආදයම් ඉක්මවූ වියදම් | 127,777.66 | | |
| වර්ෂය තුළ ජාතික විද්‍යා සභා අරමුදල් ගිණුමට වැය කරන ලද වියදම් | 102,471.08 | 230,248.74 | 259,411.26 |
| **ජංගම බැරකම්** | | | |
| වැය ණය හිමියෝ | | | 1,065.00 |
| | | | 260,476.26 |

| | 1971 ඔක්. 1 දිනට මිල | වර්ෂය තුළ එකතු කිරීම් | 1971 සැප්. 30 දින දක්වා සමුච්චිත වැය ප්‍රමාණය | 1971 සැප්. 30 ට ශේෂය |
|---|---|---|---|---|
| **ස්ථාවර වත්කම් :** | | | | |
| කාර්යාලීය උපකරණ හා ලී බඩු | 12,875.60 | 26,664.40 | 5,550.04 | 33,989.96 |
| වාහනය | 336.75 | — | 56.40 | 280.35 |
| පුස්තකාලය | 580.80 | 774.85 | — | 1,355.05 |
| | 13,793.15 | 27,439.25 | 5,606.44 | 35,625.96 |
| **ජංගම වත්කම් :** | | | | |
| භාණ්ඩාගාර තැන්පතු | | 208,160.00 | | |
| දුරකථන තැන්පතු | | 20.00 | | |
| අත්තිකාරම් වැටුප් (විවිධ) | | 250.00 | | |
| විවිධ ණය ගැතියන් | | 300.00 | | |
| ආපදා ණය (වැටුප්) | | 1,444.00 | | |
| කලින් ගෙවීම් | | 440.00 | | |
| බැංකුවේ මුදල් | | 14,036.30 | | |
| සුළු මුදල් ශේෂය | | 200.00 | | 224,850.30 |
| | | | | 260,476.26 |

1972 මාර්තු 7.

අ. ක./බී. ඒ. අබේවික්‍රම
උප සභාපති,
ජාතික විද්‍යා සභාව.

අ. ක./පී. සී. එන්. ජයසූරිය
ලේකම් ජනරාල්,
ජාතික විද්‍යා සභාව.

1968 අංක 9 දරණ ලංකා ජාතික විද්‍යා සභා පනතේ 27 (1) වගන්තිය ප්‍රකාර 1971 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා වූ ලංකා ජාතික විද්‍යා සභාවේ ගිණුම් මාගේ විධානයන් යටතේ පරීක්ෂා කරන ලදී. එම පනතට අනුකූල මාගේ වාර්තාව එම සභාවේ සභාපති වෙත 1972 අප්‍රේල් මස 11 වැනි දින ඉදිරිපත් කරන ලදී.

අ. ක./පී. ඇම්. ඩබ්ලිව් විජේරත්න
ඔඩිටර් ජනරාල්.

1972 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ 7, රජයේ ගණන් පරීක්ෂක කාර්යාලයේදීය.

## 1971 සැප්තැම්බර් මස 30 වැනි දිනට වැය ණය හිමියෝ

| | | රු. ශත |
|---|---|---|
| 1. | ප්‍රචාරණ ගාස්තු | 340. 00 |
| 2. | ගණන් පරීක්‍ෂණ ගාස්තු | 500. 00 |
| 3. | දුරකථන ගාස්තු (වෙන් කිරීම්) | 225. 00 |
| | | 1,065. 00 |

පිටපත : ක. විද්‍යා. ලේ. — පරීක්ෂිත ගිණුම්වල පිටපත් අමුනා ඇත

අංකය : (ව - 5)/13/6
1972 අප්‍රේල් මස 11 දින,
**කොළඹ 7, රජයේ ගණකාධිකාරී කාර්යාලයේ දිය.**

**සභාපති,**
ලංකා ජාතික විද්‍යා සභාව,
69, හෝර්ටන් පෙදෙස,
කොළඹ - 7.

**ලංකා ජාතික විද්‍යා සභාවෙන්**
**1971 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ**
**ගිණුම් පිළිබඳ ගණකාධිකාරී පරීක්ෂණය**

1971 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ජාතික විද්‍යා සභාවේ ගිණුම් පිළිබඳ ගණන් පරීක්ෂණය මාගේ විධානය යටතේ කරන ලද අතර 1968 අංක 9 දරණ ලංකා ජාතික විද්‍යා සභාව පනතේ 27 (2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය සඳහාවූ සභාවෙහි ගිණුම් පිළිබඳ ගණන් පරීක්ෂණය සඳහා මට අවශ්‍ය කළ තොරතුරු සහ කරුණු පැහැදිලි කිරීම් සියල්ල ම විසින් ලබා ගන්නා ලද අතර සභාවෙහි වැඩ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ ස්වරූපයක් පෙන්නුම් කෙරෙන සේ ගිණුම් නිසියාකාරව පිළියෙල කර ඇතැයි යන්න මාගේ අදහසයි.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට වැදගත් වේ යයි සිතියහැකි, සභාවේ ගිණුම් පරීක්ෂණයෙන් පැන නැගෙන කරුණු පනතේ 27 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කර ඇත.

## 2. ගිණුම් ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුලදී සභාව ආදායමක් උපදවාගෙන නොතිබුණි. වර්ෂය සඳහා සභාව විසින් දරණ ලද මෙහෙයවීමේ වියදම රු. 1,02,471 ක්වූ අතර ඉකුත් වර්ෂය සඳහාවූ මෙයට අනුරූප වියදම රු. 79,035 ක් විය. පනතේ 21 (3) වගන්තිය ප්‍රකාරව මෙම මුදල් ප්‍රමාණය ජාතික විද්‍යා සභා අරමුදලට හර කොට තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහාවූ මෙහෙයවීමේ වියදම් ඉකුත් වර්ෂයේ ඒවා සමග සසඳා පහත පෙන්නුම් කර ඇත.

| | | 1971 සැප්. 30 වැනි දිනෙන් අවසන් වර්ෂය | | 1970 සැප්. 30 වැනි දිනෙන් අවසන් වර්ෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| කාර්ය මණ්ඩලයේ පඩිනඩි | | 59,612 | | 48,501 |
| කාර්යාලයේ පාලනය | | 32,012 | | 19,823 |
| **මණ්ඩලයේ වියදම් :** | | | | |
| ජාත්‍යන්තර විද්‍යා සංගම් වලට ගෙවූ සාමාජික මුදල් | 6,266 | | 8,110 | |
| වෙනත් වියදම් | 4,581 | 10,847 | 2,601 | 10,711 |
| | | 1,02,471 | | 79,035 |

**3. ජාතික විද්‍යා සභා අරමුදල : රු. 2,59,411**

| | | |
|---|---|---|
| 1971 සැප්තැම්බර් මස 30 වැනි දිනට ශේෂය මින් දක්වුණු අතර එය මෙසේ සැදී තිබුණි. | | රු. |
| 1970 ඔක්තෝබර් මස 1 වැනි දිනට ශේෂය | | 2,12,882 |
| (අ) වර්ෂය තුලදී රජයෙන් ලැබුණු දීමනාව | | 1,41,000 |
| (ආ) **වෙනත් ලැබීම් :** | රු. | |
| (i) යුනෙස්කෝවෙන් ලැබුණ දයක මුදල් | 5,000 | |
| (ii) රජයෙන් ලැබුණ දයක මුදල් | 3,000 | 8,000 |
| | | 3,61,882 |
| **අඩුකරන්න:** සමාලෝචිත වර්‍ෂය සඳහා වූ මෙහෙයවීමේ වියදම් | | 1,02,471 |
| | | 2,59,411 |

පහත සඳහන් කර ඇති කාර්‍යයන් සඳහා සමාලෝචිත වර්ෂයේ අග හරියේදී කර්‍මාන්ත සහ විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් සභාවට ලැබුණ රු. 1,11,600 ක එකතුවක් වන දීමනා ප්‍රමාණයක් සභාව විසින් ඊළඟ අවුරුද්දට ගණන් ගෙන තිබුණි.

| **දීමනාවේ ප්‍රමාණය** | **කාර්‍යය** |
|---|---|
| රු. | |
| 89,100 | මිනිසා සහ ජීවගෝලය පිළිබඳ වැඩ සටහන |
| 22,500 | පර්යේෂණ ශිෂ්‍යත්ව / අධිශිෂ්‍යත්ව |
| 1,11,600 | |

ඉහත (ආ) (i) සහ (ආ) (ii) පිළිබඳ මාගේ අදහස් දක්වීම් පහත දී ඇත.

**(ආ) (i) යුනෙස්කෝවෙන් ලැබුණ දයක මුදල රු. 5,000**

යුනෙස්කෝවේ අනුග්‍රහය යටතේ "ජීවයේ මුල් පරිනාමය" පිළිබඳ අභ්‍යාස පාඨමාලාවක් පැවැත්වීමට ලංකා ජාතික විද්‍යා සභාව සහ යුනෙස්කෝ පිළිබඳ ලංකා ජාතික කමිටුව තීරණය කර තිබුණි. මෙම පාඨමාලාව 1972 අප්‍රියෙල් මස 1 වැනි දින පටන් ලංකා විශ්ව විද්‍යාලයෙහි පැවැත්විය යුතු වූයේය. ඉහත සඳහන් පාඨමාලාව සඳහා වූ වැඩ කටයුතුවලට සහායවීම වෙනුවෙන් සමාලෝචිත වර්‍ෂය තුලදී යුනෙස්කෝවෙන් සභාවට ලැබුණ දායක මුදල ඉහත සඳහන් මුදලින් දැක්වින. වර්‍ෂය තුලදී වියදමක් දරා නොතිබුණි.

**(ආ) (ii) රජයෙන් ලැබුණ දයක මුදල රු. 3,000**

ලංකාවේ විද්‍යාත්මක වැඩ කටයුතු පිළිබඳ සමීක්‍ෂණයන් මෙහෙයවීම සඳහා දායක මුදල වශයෙන් රජයෙන් ලැබුණ මුදල් ප්‍රමාණය මින් දැක්විත. මිනිස් බලය සහ "පර්යේෂණ සහ අත්හදා බැලීම් සංවර්‍ධනය" සඳහා වැය කරන ප්‍රමාණය පිළිබඳව වාර්ෂික සමීක්‍ෂණයක් පැවැත්වීමට ජාතික විද්‍යා සභාව තීරණය කළා ය. මෙම කාර්‍යය සඵල කර ගැනීම සඳහා, පර්යේෂණ සහ අත්හදා බැලීම් වැඩි දියුණු කිරීමෙහි නියැලී සිටින රජයේ දෙපාර්තමේන්තු, අධ්‍යාපනික ආයතන, රාජ්‍ය සංස්ථා සහ පුද්ගලික අංශයේ සමාගම් වෙත ප්‍රශ්න මාලා යවන ලදී. විද්‍යාත්මක සහ කාර්මික කටයුතු සඳහා කැප කෙරෙන සම්පත් පිළිබඳව ලොව පුරා සංඛ්‍යාලේඛණ එකතු කිරීමේ ආයාසයක් ගනිමින් සිටින යුනෙස්කෝව විසින් සභාව එකතු කරන තොරතුරු වලින් කොටසක් ප්‍රයෝජනයට ගන්නවා ඇත.

අ. ක./ **ඩී. ඇම්. ඩබ්. විජයසූරිය**
ඔඩිටර් ජනරාල්